“අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ජනාබත් තත්ත්වයෙන් (මිදීම සඳහා) ස්නානය කරන විට, එතුමාගේ අත් දෙක සෝදා, පසුව සලාතය සඳහා වුළූ ගන්නාක් මෙන් වුළූ ගෙන පසුව එතුමාණෝ ස්නානය කළහ

මුඃමින්වරුන්ගේ මාතාව වන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලදී. “අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ජනාබත් තත්ත්වයෙන්
(මිදීම සඳහා) ස්නානය කරන විට, එතුමාගේ අත් දෙක සෝදා, පසුව සලාතය සඳහා වුළූ ගන්නාක් මෙන් වුළූ ගෙන පසුව එතුමාණෝ ස්නානය කළහ. පසුව එතුමාණෝ තම සමට සේන්දු වුණු බවට
සිතන තරමට අත් දෙකින් තම රෝම අතර හොදින් ඇතුල්ලූහ. එසේ තුන් වරක් ජලය ගලා යන්නට සැලැස්වූහ. පසුව තම සෙසු ශරීර කොටස් ද සෝදා ගත්හ. මම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සමග එකම භාජනයකින් ස්නානය කර ඇත්තෙමි. අපි සෑම කෙනෙකුම
ඉන් ජලය ඇද ගත්තෙමු.”
[صحيح] [رواه البخاري]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ජනාබත් තත්ත්වයෙන් මිදීමට ස්නානය කිරීමට සිතූ විට තම අත් දෙක පළමුව සෝදා හැර ඉන් ආරම්භ කළහ. පසුව සලාතයට වුළූ ගන්නා මෙන් වුළූ ගත්හ. පසුව තම ශරීරයට ජලය ගලා යන්නට සැළැස්වූහ. පසුව තම අත් දෙකින් තම හිසකෙස් අතුල්ලූහ. කෙස් මුලට ජලය සේන්දු වූ බවට සිතන තරමටම එසේ කළහ. ශරීරයට ජලය වක් කළේය. තම හිසට තුන්වරක් ජලය වක් කොට පසුව එතුමාණන්ගේ සෙසු ශරීර කොටස් සෝදා හැරියහ. ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ පවසා සිටියාය: මම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සමග එකම භාජනයක ස්නානය කළෙමි. එහි දී අපි එකිනෙකා ඇද අහුරා ගත්තෙමු.

https://sunnah.global/hadeeth/si/show/3316